# වාරිමාර්ග අමාත්‍යාංශය

# ඇබෑර්තු

## මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - (MWSIP)

## අරමුදල් ප්‍රභවය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

මහවැලි ජල සුරක්ෂිතා ආයෝජන වැඩසටහන යනු මහවැලි බහුකාර්ය සංවර්ධන වැඩසටහනේ ප්‍රධාන සැලසුමෙහි කොටසක් වන අතර, මෙය වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කෙරෙනුයේ ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ණය අරමුදල් වලින් හා ශ්‍රී ලංකා රජය විසින් ලබාදෙනු ලබන අරමුදල් වලින් වන අතර, වර්ෂ 2024 දී සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

**අයදුම්පත් :**

පහත සඳහන් තනතුරු කොන්ත්‍රාත් පදනමින් පිරවීම සඳහා යථා පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලබන අතර, සම්පූර්ණ ජීව දත්ත සමග අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සම්බන්ධ සහතිකවල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ ඇමතුම් විස්තර සහිතව, පහත සඳහන් ලිපිනය වෙත 2021.08.23 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**වැඩසටහන් අධ්‍යක්ෂ,**
**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන,**
**අංක 493-1/1, ටී. බී. ජයා මාවත,**
**කොළඹ 10.**

**නැතහොත්, hr.mwsip@gmail.com වෙත අදාළ ලේඛන ඊමේල් කළ හැක.**

ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර, තෝරා ගැනීම කුසලතා මත සිදු කෙරේ. එසේ හෙයින්, බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය කෙරෙහි යම් බලපෑම් සිදු කිරීම හෝ නියෝජනයන් සිදු කිරීම අදාළ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතු විය හැක. මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත සමග අමුණා තිබිය යුතු අතර, සියලුම අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩලවල / සංස්ථාවල හා අනෙකුත් රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මගින් යොමුකළ යුතුවේ. එම ආයතන ප්‍රධානීන් විසින් අදාළ අයදුම්කරු මෙම තනතුරට තෝරාගත හොත් පූර්ණ කාලීනව දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන්න සඳහන් කළ යුතුය.

### තනතුරු හා රැකියා විස්තරය

**01. ජ්‍යෙෂ්ඨ ඉඩම් පවරා ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ නිලධාරී (PS-5)**

**රැකියා විස්තරය**

- ඉඩම් පවරා ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කටයුතු සම්බන්ධ ප්‍රමාද වීම් සිදු නොවීමට වගබලා ගනිමින් නිර්දිෂ්ඨ කාලසීමාව තුළදී ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා පූර්ණ සහයෝගය ලබාදීම.
- ඉඩම් පවරාගැනීම හා නැවත පදිංචි කිරීම, ආරක්ෂක ක්‍රමවේදයන් සම්බන්ධ සියලු කටයුතු සිදු කිරීම හා නැවත පදිංචි කළ ජනතාවගේ තෘප්තිය පිණිස අදාළ පදිංචි කිරීම් සැලසුම් කළ පරිදි සම්පූර්ණ කිරීම.
- ව්‍යාපෘතිය සම්බන්ධව අදාළ ජනතාව දැනුවත් කිරීම හා ව්‍යාපෘතියේ ප්‍රතිඵල වලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීම පිළිබඳ පහදා දීම.
- නැවත පදිංචි කිරීම් ක්‍රියාත්මක කිරීමේ සැලසුම් හා ජීවනෝපාය ප්‍රතිස්ථාපනය කිරීමේ සැලසුම් සම්බන්ධ කටයුතු අවසන් කිරීම සඳහා සමාජ ආර්ථික සමීක්ෂණ සිදු කිරීම.

**02. ජ්‍යෙෂ්ඨ පරිසර හා ක්‍රියාත්මක කිරීමේ නිලධාරී (PS-5)**

**රැකියා විස්තරය :**

- ව්‍යාපෘති ප්‍රදේශවල පරිසරය සම්බන්ධව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇති විය හැකි සෘණාත්මක බලපෑම් ශූන්‍ය කිරීම හෝ අඩුකිරීම සහතික වීම, වනජීවී කළමනාකරණ සැලැස්ම සහ දුක් ගැනවිලි අවම කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම හා පරිසරයේ ආරක්ෂාව සහතික කොට දුක්ගැනවිලි ඇති වීමට හේතු සොයා සහන ලබාදීම.
- දුක්ගැනවිලි සඳහා පිළියම් යෙදීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම, පරිසරය හා අධීක්ෂණ අංගයන් කෙරෙහි වන සෘණාත්මක බලපෑම් අවම කිරීම අධීක්ෂණය කිරීම, පරිසර ලිපිලේඛන (පරිසර අධීක්ෂණ වාර්තා ආදිය) පවත්වා ගැනීම හා පරිසර දැනුවත් භාවය සම්බන්ධ වැඩසටහන් පැවැත්වීම.
- ව්‍යාපෘති ප්‍රදේශ ඇතුළත වනජීවී කළමනාකරණ සැලැස්ම සාධාරනිතව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා තාක්ෂණ තොරතුරු හා නිර්දේශ ලබා දීමේ වගකීම දරන අතර, වනජීවී ආරක්ෂණය සහතික කෙරෙමින් ව්‍යාපෘතිය විසින් ආවරණිත භූගෝලීය ප්‍රදේශයේ වනජීවී ව්‍යාපෘතිවල සෘණාත්මක බලපෑම් අවම කිරීම; සහ අදාළ නියෝජ්‍යායතන හා ප්‍රජාවන් අතර ධනාත්මක හා ශක්තිමත් අන්තර් පුද්ගල සබඳතා සංවර්ධනය කොට පවත්වා ගැනීම.

**03. ජ්‍යෙෂ්ඨ සැලසුම් ශිල්පී (PS - 5)**

**රැකියා විස්තරය :**

- ව්‍යාපෘති තාක්ෂණ කාර්ය මණ්ඩලයෙහි යොමුව සඳහා දත්ත සමුදයන් පවත්වා ගැනීම
- ඉඩම් පවරාගැනීමේ හා ඉදිකිරීමේ අධීක්ෂණ කටයුතු සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සම්බන්ධව තාක්ෂණ කාර්ය මණ්ඩලයට සහාය වීම.
- ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම.
- යාවත්කාලීන කළ දත්ත සමුදාය හා ප්‍රලේඛන පුස්තකාලයක් පවත්වා ගැනීම.

**04. ජ්‍යෙෂ්ඨ සන්නිවේදන නිලධාරී (PS - 5)**

**රැකියා විස්තරය :**

- අදාළ පාර්ශවකරුවන්, ප්‍රජා සාමාජිකයන් / නායකයන් හා අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශවයන් අරමුණු කරගනිමින් රැස්වීම් හා දැනුම්වත් කිරීම් සිදු කළ යුතු අතර, ඔවුන් වෙත, බලපෑම් සිදුව ඇති ජනතාව, ව්‍යාපෘති ප්‍රදේශවල පදිංචිකරුවන් හට වැඩසටහන මගින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව පැහැදිලි කොට ඔවුන්ගේ සහයෙන් ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.
- ප්‍රජාවන්, පාර්ශවකරුවන්, කොන්ත්‍රාත්කරුවන් හා අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශවකරුවන්ද ඇතුළත්ව අනෙකුත් ජනතාව වෙත සන්නිවේදන වැඩසටහන් තුළින්, ඔවුන්ගේ සහයෝගය හා උපකරණ ලබා ගැනීම සඳහා දැනුවත් කිරීම් තුළින් වැඩසටහනෙන් ලබාගත හැකි ප්‍රතිලාභ පිළිබඳව දැනුම ලබා දීම.
- මෙම ව්‍යාපෘතිය තුළින් පළාතට හා ජාතියට ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධව විස්තර පත්‍රිකා, වීඩියෝ රූප රාමු හා සමාන ලේඛන සංවර්ධනය කිරීම.

### සුදුසුකම් හා පළපුරුද්ද

- **පහත සඳහන් සුදුසුකම් (PS - 05 සඳහා) අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛය ප්‍රකාරව වේ.**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්

හෝ

පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක පළපුරුද්ද.

2) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 11 ක පළපුරුද්ද

3) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද.

**වැටුප් තලය :** PS - 5 - රුපියල් 105,000.00 - රුපියල් 113,000.00

❖ ඉහතින් නිර්දිෂ්ඨ වැටුප්වලට අමතරව, MSD චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව ජීවන වියදම් දීමනාවද ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි**

01. අයදුම්කරුවන් වයස අවුරුදු 64 කට අඩු විය යුතුය.
02. සියලුම නිලධාරීන්, අදාළ රජයේ සංවිධාන හා අනෙකුත් නියෝජ්‍යායතන සමග සහයෝගියෙන් හා සම්බන්ධීකරණයෙන් තම රාජකාරී ඉටුකිරීම අපේක්ෂා කෙරේ.
03. ශ්‍රී ලංකාවේ සිදුකළ විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල සේවය කිරීමේ පළපුරුද්ද සහිතවීම අමතර වාසි සහගත වනු ඇත.
04. මෙම තනතුරු සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය, රජයේ රෙගුලාසි සම්බන්ධව හුරුපුරුදුතාවය හා පරිගණක සාක්ෂරතාවය අත්‍යාවශ්‍ය පූර්වාවශ්‍යතා වේ.
05. පත් කිරීම, මූලිකව, වසර එකක් සඳහා කොන්ත්‍රාත් පදනමින් වන අතර, කාර්ය සාධනය හා වැඩසටහනේ / ව්‍යාපෘතියේ අවශ්‍යතා මත වාර්ෂිකව අලුත් කළ හැක.
06. රජය අනුමත කළ වැටුප් පරිමාණයන්, දීමනා සහිතව, අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා පසු සංශෝධන ප්‍රකාරව ගෙවනු ලැබේ. (http://www.tveasury.gov.lk)

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය.**